**ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය විසින් සාමය සහ සංහිඳියාව මුල් කොට ගෙන නිර්මාණය කරනු ලබන සංගීත පිටපත් රචනය (Script Writing) සඳහා ලංසු කැඳවීම**.

උක්ත කාර්ය සඳහා ඇමුණුම iහි සඳහන් සුදුසුකම්, පළපුරුද්ද, ඇති නිර්මාණ කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය,

**සුදුසුකම් හා පළපුරුද්ද :**

1. රජයේ විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් පෞද්ගලික විශ්වවිද්‍යාලයක සාමය හා ගැටුම් නිරාකරණය, දර්ශනය, සමාජ විද්‍යාව, දේව ධර්මය හෝ දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමා මට්ටම සමත් වී තිබීම.
2. අවම වශයෙන් වසර 5 ක මෙම ක්ෂේත්‍රයේ කටයුතු කර පළපුරුද්ද.

**කොන්දේසි:**

- අයදුම් පත්‍රයේ සඳහන් කරන සියලුම සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ වන සහතික පත් වල ඡායා පිටපත් හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමුණුම ii හි සඳහන් අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.
- තෝරාගත් සංගීත පිටපත් රචක ශිල්පී, ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය සමඟ විධිමත් ගිවිසුමකට එළඹීමට එකඟ විය යුතුය.
- කිසිදු අත්තිකාරම් ගෙවීමක් සිදු නොවන අතර කාර්යය නිම කිරීමෙන් පසු ලංසු වටිනාකම චෙක් පතකින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.
- සංගීත නිර්මාණකරු සමඟ සුහද ව කටයුතු කරමින් නිර්මාණය සම්පූර්ණ කිරීම.
- සමාජය,සංස්කෘතිය සහ සාමය පිළිබඳව පණිවිඩ නිවැරදිව ප්‍රතිනිර්මාණය කිරීම.
- සංගීත නිර්මාණය සඳහා අදාළ තේමාවන් හා උචිත කතිකාව නිර්මාණය කිරීම.
- කාර්යභාරය භාර දුන් දින සිට දින 30ක් ඇතුළත අවසන් කර භාර දිය යුතු වේ.
- ලංසු පත්‍රයේ ඉලක්කමින් ඇති ලංසු වටිනාකමත් අකුරෙන් ඇති ලංසු වටිනාකමත් අතර වෙනසක් පැවතියහොත් අකුරෙන් ඇති ලංසු වටිනාකම සලකා බලනු ලැබේ.

ඉහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද ඇති හා කොන්දේසිවලට එකඟ වීමට කැමති නිර්මාණකරුවන් විසින් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ඇමුණුම iii අනුව ලංසු ඉදිරිපත් කල යුතුය.

**පිටපත් රචක ශිල්පී කාර්යභාරය :**

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය විසින් නිර්මාණය කරන සංහිඳියා සංධ්වනිය සඳහා ජාතික සමගිය අරුත් ගැන්වෙන පරිදි ආසන්න වශයෙන් පැයක පමණ දිගු සංගීත නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සංගීත පිටපත නිර්මාණය හා ඊට අනුශාංගික අනෙකුත් සියලු කටයුතු ඉටු කිරීම සංගීත පිටපත් රචක ශිල්පිගෙන් අපේක්ෂිත ප්‍රමුඛ කාර්යය වේ. එහිදී පිටපත් රචක විසින් ඉදිරිපත් කරන සංගීත පිටපත ආයතනයේ සභාපතිවරයාගේ එකඟතාවය ඇතිව නිර්මාණය කිරීම සිදු කල යුතු අතර, එසේම අවශ්‍ය

අමුද්‍රව්‍ය, ප්‍රවාහන හෝ වෙනත් අවශ්‍යතා සැපයීමක් කාර්යාලය විසින් සිදු නොකරනු ලබන අතර ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා ලබාදෙන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

**ලංසු ඉදිරිපත් කිරීම සඳහා අනුගමනය කල යුතු ක්‍රමය**

- ඇමුණුම ii හා iii ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කිරීම.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ලිපි කවරයක දමා වම් පස උඩ කෙලවරේ 'සංගීත පිටපත් රචනය' යනුවෙන් සඳහන් කර මුද්‍රා තබා 2026 / 03/ 09 වන දින ප.ව. 02.30 ට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය, නො.40, බුත්ගමුව පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල්ගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට පැමිණ බහාලිය හැකිය.
- නියමිත දින නියමිත වෙලාවට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මේ සම්බන්ධ අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය

**ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය විසින් සාමය සහ සංහිඳියාව මුල් කොටගෙන නිර්මාණය කරනු ලබන වීඩියෝ රූප රචනය (Video Script) සඳහා ලංසු කැඳවීම**.

උක්ත කාර්යය සඳහා ඇමුණුම i හි සඳහන් සුදුසුකම්, පළපුරුද්ද, ඇති නිර්මාණ කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය,

**සුදුසුකම් පළපුරුද්ද :**

- වීඩියෝ නිර්මාණකරණයේ අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.
- මීට පෙර කරන ලද වීඩියෝ රූප රචනයන් පිළිබඳ තොරතුරු.

**කොන්දේසි:**

- අයදුම් පත්‍රයේ සඳහන් කරන සියලුම සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ වන සහතික පත් වල ඡායා පිටපත් හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමුණුම ii හි සඳහන් අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.
- තෝරාගත් සංගීත පිටපත් රචක ශිල්පී, ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය සමඟ විධිමත් ගිවිසුමකට එළඹීමට එකඟ විය යුතුය.
- කිසිදු අත්තිකාරම් ගෙවීමක් සිදු නොවන අතර කාර්යය නිම කිරීමෙන් පසු ලංසු වටිනාකම චෙක් පතකින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.
- සංගීත නිර්මාණකරු සමඟ සුහද ව කටයුතු කරමින් නිර්මාණය සම්පූර්ණ කිරීම.
- සමාජය,සංස්කෘතිය සහ සාමය පිළිබඳව පණිවිඩ නිවැරදිව ප්‍රතිනිර්මාණය කිරීම.
- සංගීත නිර්මාණය සඳහා අදාළ තේමාවන් හා උචිත කතිකාව නිර්මාණය කිරීම.
- කාර්යභාරය භාර දුන් දින සිට දින 60ක් ඇතුළත අවසන් කර භාර දිය යුතු වේ.
- ලංසු පත්‍රයේ ඉලක්කමින් ඇති ලංසු වටිනාකමත් අකුරෙන් ඇති ලංසු වටිනාකමත් අතර වෙනසක් පැවතියහොත් අකුරෙන් ඇති ලංසු වටිනාකම සලකා බලනු ලැබේ.

ඉහත සඳහන් සදුසුකම්, පළපුරුද්ද ඇති හා කොන්දේසිවලට එකඟ වීමට කැමති නිර්මාණකරුවන් විසින් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ඇමුණුම iii අනුව ලංසු ඉදිරිපත් කල යුතුය.

**වීඩියෝ රූප රචනා ශිල්පී ශිල්පී කාර්යභාරය :**

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය විසින් නිර්මාණය කරන සංහිඳියා සංධ්වනියෙහි පසුපස තිරයෙහි ප්‍රදර්ශනය කරන වීඩියෝ පටය, ජාතික සමගිය අරුත් ගැන්වෙන පරිදි අසන්න වශයෙන් පැයක පමණ දිගු සංගීත නිර්මාණයට අදාළව නිර්මාණය කිරීම හා ඊට ආනුශාංගික අනෙකුත් සියලු කටයුතු ඉටු කිරීම වීඩියෝ රූප රචනා ශිල්පියාගෙන් අපේක්ෂිත ප්‍රමුඛ කාර්යය වේ. එහිදී පිටපත් රචක විසින් ඉදිරිපත් කරන සංගීත පිටපතට හා සංගීත නිර්මාණ ශිල්පිය විසින් නිර්මාණය කරන සංගීතයට අදාළ ලෙස, ආයතනයේ සභාපතිවරයාගේ එකඟතාවය ඇතිව වීඩියෝ පටය නිර්මාණය කිරීම සිදුකල යුතු අතර, Duration - පැය 01, Screen Quality – UHD/4K, Sond Quality – Surround Digital විය යුතුය. එසේම අවශය රූප රාමු, කෙටි වීඩියෝ ඛණ්ඩ, ප්‍රවාහන හෝ වෙනත් අවශ්‍යතා සැපයීමක් කාර්යාලය විසින් සිදු නොකරනු ලබන අතර ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා ලබාදෙන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

**ලංසු ඉදිරිපත් කිරීම සඳහා අනුගමනය කල යුතු ක්‍රමය**

- ඇමුණුම ii හා iii ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කිරීම.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලිපි කවරයක දමා වම් පස උඩ කෙලවරේ 'වීඩියෝ රූප රචනය' යනුවෙන් සඳහන් කර මුද්‍රා තබා 2026 / 03/ 09 වන දින ප.ව. 02.30 ට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය, නො.40, බුත්ගමුව පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල්ගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට පැමිණ බහාලිය හැකිය.
- නියමිත දින නියමිත වෙලාවට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.මේ සම්බන්ධ අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය

*ඇමුණුම 2*

**<u>ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය නිරමාණය කරන සංගීත පිටපත් රචනය (Script Writing) සඳහා අයදුම් පත්‍රය.</u>**

1. අයදුම්කරුගේ නම - ..........................................................................................................
2. ස්ථිර ලිපිනය - ................................................................................................................
3. දුරකථන අංක   ස්ථාවර - ........................................  ජංගම - .................................................
4. විද්‍යුත් ලිපිනය - ..............................................................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය - ..................................................................................................
6. දැනට කරන වෘත්තීය හෝ රැකියාව - ........................................................................................
7. තිබිය යුතු සුදුසුකම්

7.1 සාමය හා ගැටුම් නිරාකරණය, දර්ශනය, සමාජ විද්‍යාව, දේව ධර්මය හෝ දේශපලන විද්‍යාව පිළිබඳ විශාරද / ඩිප්ලෝමා / උපාධිය

| ලබාගත් ආයතනය - | වර්ෂය - |
|---|---|
| ............................................ | ................................ |
| ............................................ | ................................ |
| ............................................ | ................................ |

7.2. පළපුරුද්ද.

7.2.1. මේ දක්වා කරන ලද පිටපත් රචනයන් පිළිබඳ විස්තර
1. ........................................................................
2. ........................................................................
3. ........................................................................
4. ........................................................................

අතිරේක සුදුසුකම් - රාජ්‍ය, යෞවන හෝ වෙනත් පිළිගත හැකි සම්මාන උළෙලක ලබාගෙන ඇති සම්මාන.

| **සම්මාන උළෙලේ නම** | **ලබා ගත් වර්ෂය** |
|---|---|
| 1. ........................................................................ | ............................................... |
| 2 .......................................................................... | ............................................... |
| 3 .......................................................................... | ............................................... |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය : 2026/03/

අයදුම්කරුගේ අත්සන

*ඇමුණුම 3*

අධ්‍යක්ෂ ජනරාල්,

## ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය
## සංගීත පිටපත් රචනය (Script Writing) සඳහා ලංසු කැඳවීම

1) අයදුම්කරුගේ නම - ..........................................................................................................
2) ලිපිනය - ........................................................................................................................
3) දුරකථන අංකය - ස්ථාවර - ............................................ ජංගම - ........................................
4) විද්‍යුත් ලිපිනය - ..............................................................................................................
5) ජා.හැ.අංකය - ...................................................................................................................
6) VAT ලියාපදිංචි අංකය - ......................................................................................................
7) ඉදිරිපත් කරන ලංසු වටිනාකම - ...........................................................................................

| | ලංසු වටිනාකම(රු.) |
|---|---|
| ඇමුණුම i හි සඳහන් පිටපත් රචක ශිල්පී කාර්යය භාරය ඉටු කිරීම සඳහා | |
| එකතුව | |

8) ලංසු වටිනාකම අකුරින් -

.............................................................................................................................................

........................................................................................................................................

ඇමිණුම i හි සඳහන් කොන්දේසි වලට එකඟ වන බවත් ඉදිරිපත් කරනු ලබන සියලු ම තොරතුරු සත්‍යය හා නිවැරදි බවත් සහතික කරමි.

දිනය - 2026/03/

අයදුම්කරුගේ අත්සන